ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2255/14 – 2021 නොවැම්බර් 24 වැනි බදාදා – 2021.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 02

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2014 ඔක්තෝබර් මස 23 දිනැති අංක 1885/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2021 නොවැම්බර් මස 22 වැනි දින.

I කොටස

සංශෝධන අංක 01 - 2019 අප්‍රේල් මස 22 වැනි දින හා අංක 2120/2 *අති විශෙෂ ගැසට් පත්‍රය*

II කොටස

13.14
"පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව" යනුවෙන් අදහස් කරන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් මඟින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් විසින් පිරිනමනු ලබන අධ්‍යාපන විෂයය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව,

හෝ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පහත සඳහන් විෂයානුබද්ධ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා:

I. කොළඹ විශ්වවිද්‍යාලයේ "නාට්‍ය හා රංග කලාව" පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව
II. කොළඹ විශ්වවිද්‍යාලයේ " Teaching of English as a Second Language " පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව
III. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ " Special Needs Education " පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව
IV. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (Postgraduate Institute of Science) මගින් පිරිනැමෙන විද්‍යා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව (PGDSE),

හෝ

ජාතික අධ්‍යාපන ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අධ්‍යාපන අමාත්‍යාංශය යන ආයතනවලින් එක් නියෝජිතයකු බැගින් ඇතුළත් ත්‍රිපුද්ගල ශාස්ත්‍රීය කමිටුවක් (Academic Board) මගින් නිර්දේශ කරනු ලබන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හා සම තත්ත්වයේ ලා සැලකෙන විෂයානුබද්ධ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව වේ.

13.15

"අධ්‍යාපන පශ්චාත් උපාධියක්" යනුවෙන් අදහස් කරන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් විසින් පිරිනමනු ලබන අධ්‍යාපන විෂය පිළිබඳ පශ්චාත් උපාධිය,

හෝ

ජාතික අධ්‍යාපන ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අධ්‍යාපන අමාත්‍යාංශය යන ආයතනවලින් එක් නියෝජිතයකු බැගින් ඇතුළත් ත්‍රිපුද්ගල ශාස්ත්‍රීය කමිටුවක් (Academic Board) මගින් නිර්දේශ කරනු ලබන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන, අධ්‍යාපන පශ්චාත් උපාධිය හා සම තත්ත්වයේ ලා සැලකෙන විෂයානුබද්ධ පශ්චාත් උපාධිය වේ.

12-101

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.